# අපේ වැව්

ලංකාද්වීපයේ වරක් පැවැති මහා යශොභාවය සිහිපත් කරවන දේවල් අතුරෙන් මේ පුරාණ වැව් වල විශ්මජනක නෂ්ටාවශෙෂයෝ අග්‍රස්ථානය ලබන්නෝය. මධ්‍යම මිසරයේ තිබෙන විශාල මෝරිස් විලද' වැකණ්ඩිය කැඩී යාමෙන් ආරාබියාවේ "මාරෙබ්" නුවර විනාශවී ගිය ගුප්තවූ "අල්අරම්" නැමැති වැවද හැර අන්කිසි පුරාතන හෝ නූතන ජාතියක් විසින් කරවන ලද මෙවැනි කර්මාන්තයක් ලංකාවේ විස්ම ජනක වැව්වල විශාලත්වය නොපරදවන්නේ ය. අජ්මීර් ජාතිකයන් විසින් සාදන ලද "ඉස්පහාන්" නගරයෙහි "කොහ-රඩ්" නමැති වැවත්, මයිසෝර් රටේ "හයිඩර්" නම් ජලාසයත්, කලාවැව හෝ (පඩවිල් කුලම්) පදවිය වැව සමග විශාලත්වයෙන් හා ලක්ෂණයෙන් කිසිසේත් සමාන කළ නොහැක. එසේම හැසරියා රටේ තිබෙන වාරිමාර්ගවත්: පර්සියාවේ තිබෙන ඇලවල්වත්; පේරු රටේ පොලව යටින් සාද තිබෙන ජලමාර්ගවත් මින්නේරිය වැව සහ පරාක්‍රම සමුද්‍රය අඹන් ගඟට යාකිරීමට තනන ලදැයි සිතිය හැකි "ඇල්ලහැර" නම් ඇල සමග විශාලත්වයෙන් සමාන කළ නොහැක.

— සර් ඇමර්සන් ටෙනන්ට්